# මේ රවි උච්ච බක් මාසයයි.

දරුවන් යනු සම්පතකි. මීට දශක තුන හතරකට පෙර සිටි පවුල් වලට දරුවන් තුන් හතර දෙනෙක් අනිවාර්යෙන්ම සිටියේය. එහෙත් අද පවුල් වල දරුවන් දෙදෙනෙකුටත් අවම වශයෙන් එක් අයෙකුටත් සීමා වන තත්වයට පත්ව ඇත. තත්වය එසේ තිබියදී දරුවන් නොමැතිව ලතවෙන අයද වෙති. එයට හේතුව ඒ අයගේ ජන්ම පත්‍ර පරීක්ෂා කළ විට මනාව පැහැදිලි වේ.

ජන්ම පත්‍රයේ සටහන් වන්නේ පෙර භවයේ කරන ලද කුසල අකුසල කර්ම බලවේගයි. ජන්මයෙන් පසුව මෙලොව කරන කර්ම ජන්ම පත්‍රයේ සටහන් නොවේ. එහෙයින් දරුඵල නොමැති නම් ඇති තත්වයට සඵල කර ගැනීමට මෙලොව වශයෙන් කරන යම් පිළිවෙත් සහ ශාන්ති කර්ම වලට හැකිවන්නේය. එයට කල් තබා තම ග්‍රහබලය කෙසේදැයි බලවා ගත යුතුය. මේ රවි උච්ච මාසයයි. මෙවර අප්‍රේල් 14 උදේ 6.58 ට රවි සිය උච්චස්ථානය වන මේෂ රාශියට ඇතුල් වේ. සිංහල අළුත් අවුරුදු උදාව ලෙස හැඳින් වෙන්නේ එයයි. රවි සිය උච්ච ස්ථානයට ඇතුල් වීමෙන් එතෙක් පැවති දෝෂ සතර භංග වී අවුරුද්ද උදාවේ. රාශි ගණ්ඩාන්ත දෝෂය, නැකැත් ගණ්ඩාන්ත දෝෂය, නැකතේ අන්ත දෝෂය, කෝණ මාස දෝෂය, නොනගතය සම්පූර්ණ වීමත් සමගම මෙම දෝෂ සියල්ල ඉවත් වේ.

රවි යනු ආත්ම කාරක ග්‍රහයායි. කෙනෙකුගේ රවි බලවත් වීම යනු ඔහු හොඳ ආත්ම ශක්තියක් ලැබීමයි. ලෝකයේ ජීවය , එම ශක්තිය පැවැත්ම, ඉදිරියට යාම රඳා පවතින්නේ රවිගේ බලය මතයි. රවිගේ බලය නොමැතිව මෙලොව කිසි දෙයක් නොපවතී. එසේම කෙනෙකුගේ ප්‍රජනන ශක්තියටද රවිගේ බලපෑම ප්‍රධාන තැනක් ගනී. එසේම ඉදිරි මාසය තුළ එනම් මැයි 3 වන දින ගුරු මීන රාශි ගතවේ. මෙය වසර දොළහකට පසු සිදුවන්නකි. ඉදිරි කාලය දරුඵල නොමැති අයට ඒ සඳහා බලාපොරොත්තු ඇති කරගත හැකි කාලයකි.

# දරුඵල නැති අයට

## ග්‍රහබලයෙන් සහනයක්

ගුරු යනු ප්‍රභාවට අධිපති මෙන් පුත්‍ර කාරක ග්‍රහයායි. ගුරු උපතේදී සිටීම අනුවත්, දරුඵල ඇති නැති බව තීරණය කළ හැකිය. එසේම නොමැති නම් තමන්ගේ අකුසල කර්මයට අදාල වන ප්‍රතිකර්මය කුමක්ද යන්න දත හැකිය. එයට ඉතා සියුම් විදියට හෙවත් "ඉන්දියානු නාඩි ක්‍රමයට" ජන්මපත්‍රය විශ්ලේෂණය කළ යුතුය. එයින් පසු ස්ත්‍රී පුරුෂ දෙදෙනාගේම ග්‍රහ බලය අනුවත්, ස්ත්‍රියගේ ඔසප් චක්‍රය අනුවත්, ගුරු හා රවිගේ බලය වඩාත් තමන්හට ලැබෙන දිනත්, නැකැත් ගැනත් යෙදෙන දිනත් තෝරා බේරා ගත යුතු අතර, ඉන්පසු එම දිනයන් තුළ ස්ත්‍රී පුරුෂ ඇසුර පවත්වාගත යුතුය.

විශේෂයෙන් මෙම කාල සීමාවන්, දිනයන් පවතින්නේ ඉතා අල්ප වශයෙනි. ඉතා විශාල ලෙස සූක්ෂම ලෙස ජන්ම පත්‍රය පරීක්ෂා කර තීරණය ගත යුතුය. ජ්‍යොතිෂය මැනවින් හසුරුවන්නෙකුට එම ශාස්ත්‍රය ජය ගත හැකිය. වඩාත් සුදුසු ක්‍රමය වන්නේ වෛද්‍ය ප්‍රතිකර්ම වලට යොමුවන ගමන් ග්‍රහබල තත්වයන් ගැන අවධානය කිරීමයි. දරුඵල නැති අය සඳහා ප්‍රතිකාර කරන මා දන්නා දක්ෂ සිංහල වෛද්‍යාචාරියක් ප්‍රකාශ කලේ ස්ත්‍රී පක්ෂයේ හෝ පුරුෂයන්ගේ ප්‍රජනන ඉන්ද්‍රියන්ට විශේෂයෙන් ශරීරයේ පවතින කඳ උෂ්ණාධික තත්වය බලපාන බවයි.

